122830
T
07/10

300/-

# අනිවාර්ය පාසැල් විය ඉක්මීමට පෙර විධිමත් අධ්‍යාපනය අවසන් කිරිම.

අධ්‍යාපනපති කේ. ඩී. ගුණතුංග 1974

122830

# අනිවාර්ය පාසැල් විය ඉක්මීමට පෙර විධිමත් අධ්‍යාපනය අවසන් කිරීම.

ජේ. ඩී. ගුණතුංග.

1974

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ - විද්‍යෝදය මණ්ඩපයේ
1974 අධ්‍යාපන පති උපාධි පරීක්ෂණය

සඳහා

ඉදිරිපත් කෙරෙන නිබන්ධනය.

(((((

# පටුන.


ස්තූතිය.

| | | පිටුව |
|---|---|---|
| | I. කොටස - හැඳින්වීම | |
| 1 වන පරිච්ඡේදය : | හැඳින්වීම හා අන්වේෂණයේ අභිප්‍රාය. | 1 - 6 |
| | II. කොටස - ක්‍රම විද්‍යාව. | |
| 2 වන පරිච්ඡේදය : | පෙර කරන ලද අන්වේෂණයන්ගේ සමාලෝචනයක් | 7 - 34 |
| 3 වන පරිච්ඡේදය : | නියැදිය හා ශිල්ප ක්‍රම. | 35 - 44 |
| | III කොටස - විග්‍රහය. | |
| 4 වන පරිච්ඡේදය : | ගැටලුව විග්‍රහය. | 45 - 53 |
| 5 වන පරිච්ඡේදය : | සමාජමය හේතු. | 54 - 78 |
| 6 වන පරිච්ඡේදය : | ආර්ථික හේතු. | 79 - 92 |
| 7 වන පරිච්ඡේදය : | අධ්‍යාපනික හේතු. | 93 - 113 |
| 8 වන පරිච්ඡේදය : | සංස්කෘතික හේතු. | 114 - 125 |
| 9 වන පරිච්ඡේදය : | සම කණ්ඩායම් වල බලපෑම. | 126 - 132 |
| | IV. කොටස - ප්‍රතිඵල | |
| 10 වන පරිච්ඡේදය : | I සාරාංශය හා නිගමන. | 133 - 138 |
| | II පිළියම් හා යෝජනා. | 139 - 145 |
| | V. කොටස - උප ග්‍රන්ථය. | |
| අංක I : | පෙර කරන ලද වෙනත් අධ්‍යයන. | 146 - 146 |
| අංක II : | I. නියැදියට අයත් පාසැල්, හා ජනගහනය. | 147 - 148 |
| | II. නියැදියට අයත් ප්‍රදේශය දැක්වෙන සිතියම. | 149 - 150 |
| | III. සම්මුඛ පරීක්ෂණ ප්‍රශ්නාවලි. | 151 - 159 |
| අංක III : | I. පාසැල් හැරයාම පිළිබඳ සංඛ්‍යා ලේඛණ. | 160 - 164 |
| | II. වෘත්තීය ශ්‍රේණි හා ආදායම් මට්ටම් | 165 - 165 |
| අංක IV : | පාසැල්හැරයාමේ හේතු වර්ගීකරණ. | 166 - 167 |

# ස්තූතිය.

මෙම පර්යේෂණ නිබන්ධනය සම්පාදනය කිරීමේ දී නොයෙකුත් උපදෙස් දීමෙන් මට මග පෙන් වූ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපයේ අධ්‍යාපන විද්‍යා අංශයේ ප්‍රධාන ඩී. අරම්පත්ත මහතාට මගේ ස්තූතිය ප්‍රථමයෙන්ම පුද කළයුතුව ඇත. නොයෙක් අවස්ථාවලදී ඔහුගෙන් ලැබුන කාරුණික අනුග්‍රහය මට මහත් ධෛර්යක් විය.

පර්යේෂණය සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගැනීමේ දී දොඩන්ගස්ලන්ද අධ්‍යාපන මණ්ඩලයේ කිරිබමුණ, කොස්වත්ත, හොකරල්ල, නිකංගම, පානගමුව, පුස්සැල්ල, බුලුවල, රත්විට, රම්බඩගල්ල හා ඊද්ද ගොඩ යන විදුහල්වල විදුහල්පතිවරුන් දැක්වූ අනුග්‍රහය මට බලවත් ලෙස උපකාරී විය.

තවද සම්මුඛ පරීක්ෂණ හා නිරීක්ෂණ මෙහෙයවීමේදී සහාය දුන් ටී. එම්. චන්ද්‍රතිලක, යූ. ජී. ගුණරත්න, නිමල් ඕලගම, එච්. අයි. මුතුබණ්ඩා, බී. ඩී. නවරත්න, එස්. එම්. ජලාල්දීන් හා යූ. කේ. බී. කන්දෙපොල යන මහතුන්ට ද දොඩන්ගස්ලන්ද අධ්‍යාපන මණ්ඩලයේ සිතියමක් පිළියෙල කර දුන් බී. සුමනදාස මහතාට ද මාගේ ස්තූතිය හිමිවිය යුතුය. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවලට පැමිණ සහභාගිවී ප්‍රතිචාර දැක්වීමෙන් සහාය දැක් වූ සිසුන් ගුරු දෙගුරුන් සියලු දෙනාට ද ,

අවසාන වශයෙන් , ඉතාම කෙටි කාලසීමාවකදී මට මෙය ටයිප් කරදුන් මා සොහොයුරු සද්ධාරත්න රාජපක්ෂ මහතාටද මගේ ස්තූතිය පුද කරමි.

## පළමුවන පරිච්ඡේදය.

## හැඳින්වීම හා අන්වේෂණයේ අභිප්‍රාය.

නියමිත පාසැල් විය ඉක්මීමට පෙර විධිමත් අධ්‍යාපනය අවසන් කිරීම අද විශාල ගැටලුවක් වී තිබේ.විශේෂයෙන් ම අධ්‍යාපනයේ ප්‍රථම මට්ටම ( 1 - 8 ශ්‍රේණි) තුළදී සිදුවන පාසැලෙන් ඉවත්ව යාම ඉතාමත් බහුලය.ඇතුළත් වන ප්‍රමාණය වැඩිවෙමින් පවතිනත් පාසැලෙන් ඉවත්ව යන්නන්ගේ ප්‍රමාණය වැඩිවෙමින් පවතී.ලෝකයේ රටවලින් වැඩි කොටසක ම ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වන අයගෙන් අඩක්ම වාගේ ප්‍රාථමික මට්ටම නිම නො කරති . මෙසේ ඉවත්ව යන අය එසේ ඉවත්ව යන්නේ උපරිම ඵල නෙළා ගෙන ද නොවේ.බොහෝ රටවල් ගැන බලන විට එම රටවල ජාතික අධ්‍යාපන අයවැයෙන් ඔවුන්ට වැය කරන වැය කිරීම් වලින් උරා ගනු ලබන්නේ 20% සිට 40 % අතර දක්වා ප්‍රමාණයකි.[1] මේ අනුව ලෝකයේ බොහෝ රටවල් ගැන බලන විට ආරම්භයේ දී ඇතුළත් වන ශිෂ්‍ය ප්‍රමාණයට වඩා අවසානයේ දී පාසැලේ ඉතිරි වන ප්‍රමාණය ඉතා කුඩාය.[2]

මෙය දියුණු වී ගෙන යන රටවල මෙන් ම දියුණු වූ රටවල ද පවතින ජාත්‍යන්තර ගැටලුවකි.එහෙත් දියුණුවෙමින් පවත්නා රටවල මේ ප්‍රශ්නය වඩාත් උග්‍රය.[3] අධ්‍යාපනය වෙනුවෙන් මෙම රටවල් කරන විශාල කැප කිරීම් කො යි හැටි වුවත් වඩාත් වේලාසනින් පාසැල් හැර යාමේ ප්‍රශ්නය උග්‍රවෙමින් පවතින අතර,එය එම රටවලට විශාල වියදම් සහිත බරක් ද වී ඇත.[4] දියුණු වී ගෙන යන රටවලිනුත් වැඩි පුරම මෙම ප්‍රශ්නය බලපාන්නේ ලෝකයේ ජනගහනයෙන් වැඩිම කොටසක් වෙසෙන ආසියානු කලාපයේ ය. 1960 දී ආසියානු කලාපයේ රටවල පළමුවැනි ශ්‍රේණිය සඳහා ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව ද:ල: 24.5 කි. මෙයින් ප්‍රාථමික මට්ටමේ 4 වැනි ශ්‍රේණියට ළඟා වී ඇත්තේ ද:ල:11.5 කි. ( 47 % කි.) ඉතිරි ප්‍රමාණය එනම් 53 % ක් පමණම දෙනා 4 වැනි ශ්‍රේණියට ළඟාවීමට ප්‍රථම හෝ 4 වන ශ්‍රේණියේ දී පාසැලින් ඉවත් ව ගොස් ඇත.[5] ආසියානු කලාපයේ මෙම ගැටලුව කොතරම් තදින් බලපාන්නේ ද යන්න මින් පෙනේ.

අනිවාර්ය පාසැල් විය ඉක්මීමට පෙර විධිමත් අධ්‍යාපනය නිම කිරීමේ ගැටලුව ශ්‍රී ලංකාවේ ද ඉතා තදින් බලපාන ප්‍රශ්නයකි.ශ්‍රී ලංකාවේ අනිවාර්ය පාසැල් විය යනු 1939 ලංකා අධ්‍යාපන ව්‍යවස්ථාවේ 50 වන ඕ උප වගන්තියේ විස්තර කරන ලෙසට ළමයකු පාසැලට ඇතුළත් වීමට හැකි වන ලෙසට පනවනු ලබන අවම හා උපරිම වයස් ප්‍රමාණයක් අතර කාල පරිච්ඡේදයයි.[6] ඒ අනුව ලංකාවේ අනිවාර්ය පාසැල් වයස් සීමාව අවුරුදු 5 - 14 අතර වේ.අනිවාර්ය නීතිය එසේ වුවත් පාසැල් යා යුතු එම වියේ අයගෙන් සැලකියයුතුප්‍රමාණයක් කිසි දිනක පාසැල් නො යන අතර පාසැල් වලට ඇතුළත් වන අයගෙන් ද විශාල සංඛ්‍යාවක් ප්‍රාථමික මට්ටම සම්පූර්ණ කිරීමට පෙර පාසැලින් ඉවත් ව යති. 1960 දී කරන ලද සමීක්ෂණයට අනුව ඒ වන විට ශ්‍රී ලංකාවේ පාසැල් නොයන්නවුන් ගේ සංඛ්‍යාව 412000 කි. අ එනම් 20.6 % ක් ම කිසි දිනක පාසැල් නො ගිය අයයි.[7] තවද 58 % ක් පමණ දෙනා [illegible] අවුරුදු 14 ට පෙර පාසැල්වලින් ඉවත් ව ~~යති~~ ගොස් ඇත.එහෙත් මේ ප්‍රමාණය සැහෙන පමණකින් දැන් අඩු වී ඇත.[8] 1970 දී ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යාපනය ලැබූ 89 % ක් දෙනාගෙන් ද්විතීය අධ්‍යාපනය සඳහා ඇතුළත් වී ඇත්තේ 31 % කි. මූලික අධ්‍යාපනය ලබන ඉතිරි 58 % ක් ම අවුරුදු 12 වන විට පාසැල්වලින් ඉවත් වන බව පෙනේ.[9] පළමුවන ශ්‍රේණියේ ඉගෙනුම පටන් ගන්නා ළමයින් සෑම සියයකගෙන් ම හයවන ශ්‍රේණිය වන විට ඉතිරි වන්නේ 60 % කි. ඉතිරි 40 % ඉවත්ව යයි .[10]. පළමුවන ශ්‍රේණියට ඇතුල්වන ළමයින්ගෙන් හරි අඩක්ම 8 වන ශ්‍රේණිය දක්වා ඉගෙනීමට කලින් පාසැල් හැර යයි.[11] මේ අනුව ශ්‍රී ලංකාවෙහි අනිවාර්ය පාසැල් විය ඉක්මීමට පෙර 40 % ක් පමණ ම වසර පතා පාසැල්වලින් ඉවත්ව යන බව පෙනේ.

අපි දියුණු රටක් වූ ශ්‍රී ලංකාවද ආර්ථික වශයෙන් අබල දුබල තත්වයක සිට ගෙන ද අධ්‍යාපනය වෙනුවෙන් විශාල ධනස්කන්ධයක් වසර පතා වැය කළත්, එයිනුත් නිසිඵල ලබා නො ගෙන මෙසේ විශාල ප්‍රමාණයක් ඉවත් ව යන බව පෙනේ. අප රට අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන ප්‍රමාණය වසරින් වසර වැඩිවෙනවා මිස අඩුවීමක් නැත. 1950 දී ජාතික ආදායමෙන් අධ්‍යාපනය සඳහා වැය කර ඇත්තේ 3.0 % කි[12]. 1966 දී මෙය 4.9% දක්වා වැඩි වී ඇත. ඒ අතින් අපරට දෙවැනි වී ඇත්තේ ආසියාවෙන් ජපානයට පමණි. ජපානයේ 1966 දී එම ප්‍රමාණය 5.7 % කි. අධ්‍යාපනය වෙනුවෙන් ඉන්දියාව 1965 දී වැය කර ඇත්තේ ජාතික ආදායමෙන් 2.1% කි. ආර්ථික වශයෙන් දුර්වල තත්වයක සිටගෙන ද අප රට අධ්‍යාපනය වෙනුවෙන් විශාල, ඉසිලිය නොහැකි වියදමක් කරන බව පෙනේ. 1973 වසරේදී මෙම වියදම 5.4 % දක්වා නැග ඇත. මෙපමණ මුදලක් අධ්‍යාපනයට රජය වැය කරන්නේ මානුෂික අයිතිවාසිකමක් වන, සැම කෙනකුටම කිසි ද වර්ග භේද, ජාති භේද ආදියක් නො සලකා අධ්‍යාපනයක් ලබාදීම සඳහා පමණක් නොවේ. පුද්ගලයා තුළ ඇති අවිද්‍යාව නැතිකර, ඔහු ගේ ප්‍රජානන, කායික, සමාජ, චිත්ත වේගාත්මක, සෞන්දර්යාත්මක, සදාචාර හා අධ්‍යාත්මික අවශ්‍යතා සැපිරීම මගින් පූර්ණ ලෙසින් වර්ධනය වූ පුරවැසියකු ලෙසින් ද පුහුණු කර ගැනීම සඳහාය. තම මව්බිම, එහි සම්ප්‍රදායන් හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ඇති, එසේම ජාත්‍යාලයෙන් ද යුත් ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් බිහිකර ගැනීම අද අවශ්‍ය වී තිබේ. පුද්ගලයා හා සමාජය අතර ඇති සම්බන්ධය ගැන බලන විට, ඔහුට සමාජයෙන් වෙන්ව එක මොහොතක්වත් ජීවත්විය නො හැක. සමාජයෙන් වෙන් වූ පුද්ගලයා දියෙන් ගොඩට ගනු ලැබූ මාලුවකුට සමානය. සමාජයේ ඇති වැදගත්කම, ඒ පිළිබඳ ඇති අවබෝධය හා සමාජය වෙනුවෙන් ඔහු තුළ තිබිය යුතු ඇපකැපවීම්ද (social committment) අන් කවර ලෙසකට ද වඩා විධිමත්ව අවබෝධ කර දිය හැක්කේ අධ්‍යාපනයට පමණි[13]. වෙනස්වෙමින් හා සංවර්ධනය වෙමින් පවතිනා සමාජයට ගැලපෙන ලෙසට පුද්ගලයා සකස් කළ යුතුව ඇත. තම අනුගාමිකයන් සමඟ සතුටුදායක ලෙසින් අන්‍යොන්‍ය සම්බන්ධතා ඇති කර ගැනීම මගින් ඔවුන් සමඟ ජීවත්වීමට ද සමාජයේ වෙනස්කම් පිළිගැනීමට, ඒ වෙනස්කම් අනුව හැඩ ගැසීමට මෙන් ම සමාජය දෙස විවේචනාත්මක ව බැලීමට ද ශක්තිය ලබා ගත යුතුය.[14]

පුද්ගලයාට එල්ලවන විවිධ බලවේගහා පීඩන වලින් තොරව තනිව මෙන් ම සාමූහිකවද සාර්ථක ව ක්‍රියා කිරීම සඳහා පුද්ගලිකත්ව භාවයේ පූර්ණ වර්ධනයක් ලැබිය යුතුය. තමා කවරෙක්ද යන්න තේරුම් ගැනීම, තම කුසලතා දියුණු කර ගැනීම, තම වගකීම් හා යුතුකම් හඳුනා ගැනීම මෙන් ම වගකීම් ඉසිලීම ද අවශ්‍ය ය[15]. එදිනෙදා ජීවිතයේ දී හමුවන දහසක් ජීවන ගැටලු අන්‍යයන් ගේ සහායක් නැතිව, අනුන්ට වහල් නොවී තමා විසින් ම විසඳා ගැනීමේ ශක්තිය, තාර්කික හැකියාව, උත්පාදක චින්තනය හා ඇගයීමේ හැකියාව ද තිබිය යුතුය. මිනිසා බොහෝ අවස්ථාවල හදිසි තීරණ ගන්නේත්, විනාශයන්ට එළඹෙන්නේත් ඔහු තුළ මනා චිත්තවේගීය පාලනයක් නැති නිසාය. අභ්‍යන්තර නිදහස, පෞද්ගලික ස්වාධීනත්වය හා පෞද්ගලික අරගලකාරිත්වයන් විසඳීමට ධාරිතාව ද තිබිය යුතුය.[16] නව ලෝකය නිසා මිනිසා ගේ මානසික අසහනය, කාංසාව හා සැක සහිත බව වැඩි වී ඇති අතර, පුද්ගලික නිදහස හා විශාල සමාජයෙහි ආරක්ෂාවීම යන දෙක ඔහුට තෝරා බේරා ගැනීමට දුෂ්කර වී ඇත. තමා ගේ සුරක්ෂිත බව තමා විසින් ම මීට වඩා සුරක්ෂිත කර ගත යුතුව ඇත. ස්වයථාර්ථනිරූපනය හා ස්වපරිපූර්ණත්වය සඳහා විවෘත මනසක් ඔහු තුළ තිබිය යුතුය.

ලෝකයට උත්පාදනය වන පුද්ගලයාගෙන්, පුද්ගලිකව ඔහුටද, පොදුවේ මුළු මහත් සමාජයට ද යම් අර්ථදායී සේවාවක් ඉටුවිය යුතුය. නව දේවල් සෙවීම මගින් දියුණුවේ ඉදිරි ගමනට ඔහුද කොටස්කාරයකු විය යුතුය. නව දේවල් ගවේෂණය කර ගත හැක්කේ පුද්ගලයා තුළ නිර්මාණාත්මකභාවය තිබුණහොත්ය. මෙහිදී ක්‍රියාව හා චින්තනය එකලෙසින් වැදගත්ය.

වියුක්තව සිතීමට, තර්කානුකූලව ක්‍රියා කිරීමට පුද්ගලයාට හැකිවුවහොත් පමණි, සමාජයේ ඉදිරි ගමනට ඔහු දායකයකු වනවා ඇත්තේ. සමාජයේ ඉදිරි ගමනට බාධා කරන, එසේම පුද්ගලයා ගේ පුද්ගලිකත්වයට හානි පමුණුවන නොයෙකුත් බලවේග අද මිනිසා හමුවේ ඇත. මේවා සාර්ථක අන්දමින් ජය ගැනීමට නම් ඔහු ඒවා දෙස විද්‍යාත්මක දෘෂ්ටියකින් බැලිය යුතුව ඇත. ලෝකයේ යථාස්වභාවය අවබෝධකර ගත හැක්කේත්, වෙනස්වීම් පිළිගෙන ඒවාට අනුවර්තනය විය හැක්කේත්, එසේම අනවශ්‍ය අගය ඉවත් කර ගත හැක්කේත් විද්‍යාත්මක ආකල්ප හා සිතුම් පැතුම් ඇත්නාටය. විද්‍යා හා තාක්ෂණික සොයා ගැනීම්, කාර්මිකරණය ආදිය හේතු කොට ගෙන මිනිසා තුළ අද මහත් විශේදන තට ගනිමින් පවතී. අද පෙරට ද වඩා ඉච්චාභංගය, කාංසාව, හා නව තර්ජන ද වැඩිවෙමින් පවතී. මිනිසා ගේ මානුෂික වටිනාකම පහත වැටෙමින් ඒ වෙනුවට ද්‍රව්‍යවාදී බව වැඩිවෙමින් පවත්නා සමයක මානවීය බව යළි යළිත් කෙසේ හෝ මතුකර ගත යුතු වෙමු. මෙම මානවීය බව මතුකර ගත හැක්කේ, ඒ දෙස විද්‍යාත්මක ආකල්ප ඇතිව බැලුවහොත් පමණි. ඉවසීම, දයාව, අනුකම්පාව හා උපේක්ෂාව වැනි මානවීය ගුණාංග ඇතුළත් හොඳ චරිත සංවර්ධනයක් ඔහු තුළ සිදුවිය යුතුමය.

ඉගෙනීමේ මූලික මෙවලම් පිළිබඳ මනා නිපුණත්වයක් අද සෑම පුද්ගලයකුම ලබා ගත යුතු වේ. හුදු කියවීම, ලිවීම පමණක් නොවේ මින් අදහස් වන්නේ. අකුරු උගත්බවට ද (*Literacy*) වඩා අද අවශ්‍ය වී ඇත්තේ විද්‍යාව උගත්බවයි. කියවීම හා ලිවීම මගින්, අදහස් උදහස් හුවමාරු කර ගැනීමටද ප්‍රකාශ කර ගැනීමටද හැකියාව ලබා ගත යුතුය. විද්‍යා හා තාක්ෂණ දියුණුව ජනසංවේදන මාධ්‍ය ආදිය නිසා, පුපුරා ගොස් දසත ගලා යමින් පවතින නව දැනුම අත්පත් කර ගැනීමේ හැකියාව, නවක්‍රම වලට අනුවර්තනය වීමේ හැකියාව ලබා ගත හැක්කේ හැමදාම ඉගෙනිම ලබමින් සිටින්නකු වුවහොත්ය [17]. ඒ නිසා ඉගෙනීමට ඉගෙනීමේ හැකියාව සෑම කෙනෙක්ම ලබා ගැනීම ඉතාම අවශ්‍යය. සමහර විට පාසැල් අධ්‍යාපනය ලබන කාලය තුළ කෙනෙකුට ඉගෙන ගන්න ලැබෙන්නේ ඉතා ස්වල්පයකි. පාසැලින් ඉවත් වූ පසු ද එවිට ඔහුට ඉගෙනීමට සිදු වේ. එසේ කර ගෙන යාමට නම් ඉගෙනීමට ඉගෙනීමේ හැකියාව ඔහු පාසැලින් ලබා ගත යුතුය. ඉගෙනීම යන්න යාවජීවය. පාසැල් යාමෙන් ඇරඹී පාසැල් ගමන අවසන්වීමෙන් කෙළවර වන්නක් නොවේ. [18] එය ජීවිතයෙන් ඇරඹී ජීවිතයේ අවසානයෙන් කෙළවර වන දෙයකි. [19] ඉගෙනීම යන්න පුද්ගලයා ගේ ජීවිත කාලය පුරා සිදුවන යාවජීව ක්‍රියාවලියකි, මේඅනුව. පුද්ගලයා සෑම දාම සිටින්නේ අසම්පූර්ණ වූ හා අසමතුලිත වූ තත්වයකයි. කිසිදිනක ඔහු ගේ දැනුම සම්පූර්ණ වූ එකක් නොවේ. ස්වීකරණය හා ප්‍රතියෝජනය මගින් ඔහු දිනෙන් දිනම අලුත් වන සත්වයකි. පාසැල වැනි සැලසුම් කළ ආයතනවලින් මෙන් ම සැලැසුම් නො කළ ආයතනවලින් ද ආනුෂංගිකව ද ඉගෙනීමට සිදු වේ. පවුලෙන් ප්‍රජාවෙන්, ප්‍රජාවේ නොයෙක් කණ්ඩායම් වලින් ජීවිතයෙන්, හා ජනසංවේදන ආදි නොයෙක් දේවලින් ඔහු ඉගෙනීම ලබමින්, සමෝධානිකව සිය පෞරුෂය වර්ධනය කර ගැනීමද එමගින් ජීවිතියේ ගුණාත්මක වර්ධනය හා එය පවත්වා ගෙන යාමද කර ගනී. තමා යෙදී සිටින වෘත්තියේ ගුණාත්මක බව වැඩි කර ගැනීමටද නව ක්‍රම අනුව හැඩ ගැසීමටද සිදු වේ. පාසැලින් ලබන විධිමත් අධ්‍යාපන කාල සීමාව තුළදී ~~පුද්ගලයා ජීවිත~~ පුද්ගලයකු ගේ ජීවිතයට අවශ්‍ය සියලු ම කුසලතා දැනුම හා පුරුදු ලබා ගත නො හැකි නිසා එයින් ඉවත් වූ පසුද ඉගෙනීම ලැබීමට සූදානම් විය යුතුය." අද කාලයේ ලබා ගන්නා තොරතුරු වලින් වැඩිහරියක් ම ලබා ගැනීමට සිදු වී ඇත්තේ යාවජීවයෙයින් කෙරෙන ඉගෙනීම මගිනි. ඉගෙනීමට ඇති දෙය 100 ක් නම් ඉන් 60 % ක් පමණම ලබා ගත යුත්තේ කියවීම මගිනි." [20] දැනුම විශාල වශයෙන් ගොඩ ගැසෙන හා ගලා යන අද වැනි කාලයක අදට මෙන් ම හෙට ගැනද වැඩි වැඩියෙන් සූදානම් වීමට ඇති සමයක යාවජීව ව කෙරෙන අධ්‍යාපනයෙන් කිසිද කෙනකුට මග හැර සිටිය නො හැකිය. වෙනස්වෙමින් පවත්නා ලෝකයේ අධ්‍යාපනයේ අරමුණු කෙබඳු ආකාරයේ ඒවා විය යුතුදැයි මහාචාර්ය *Adlai Stevenson* මහතා මෙසේ දක්වා ඇත.

" එමින් පවත්නා දශකවල ඇති විය හැකි වෙනස්කම් සඳහා අප පමාවිය යුතු නොවේ.මිනිසුන් ගේ ප්‍රතික්‍රියා ඒවා වෙනුවෙන් වෙනස් කර ගැනීමට අපි උත්සාහ කළ යුතු වෙමු.මේ සියල්ලම සඳහා මා දකින අත්‍යවශ්‍ය ම දෙය නම් අධ්‍යාපනයයි." *21 යනුවෙනි. මේ නිසා ඉගෙනීමේ උපකරණ,කාලය හා මාධ්‍යය ආදිය ස්වශක්තියෙන් භාවිතා කිරීම මගින් යාවජීව ලෙසින් ඉගෙනීම පිළිබඳව ආකල්ප හා පුරුදු මුල සිට ම පාසැල මඟින් ඇති කළ යුතු වේ.පාසැලින් විශේෂයෙන් ප්‍රාථමික අධ්‍යාපනයෙන් මෙම ශක්තිය හා ඉගෙනීමේ පරිසරය ඇති කෙරෙන අතර,පාසැලින් ඉවත් වූ පසු ඉගෙනීම කේන්ද්‍ර කර ගත් සමාජයක නියම කොටස් කාරයකු බවට ද ඔහු පත් වේ.ඉතා පුලු දැනුම් ප්‍රමාණයක් ලබා ගෙන පාසැලින් ඉවත්වන ඔහු,අධ්‍යයන කේන්ද්‍රිය සමාජයට පිවිසීමෙන් පසු සිය පරිපූරණත්වය සඳහා ඒ ඒ අවස්ථාවලදී අවශ්‍ය දැනුම ලබා ගනී.මේ අනුව අධ්‍යාපනයෙන් ඉතා බලාපොරොත්තු වන්නේ පුද්ගලයා ගේ ප්‍රජානන,වින්දන හා මනෝචාලක කුසලතා ශක්තීන් හා හැකියාවන් ද අතින් පූර්ණ වර්ධනයක් ඇති කිරීමත් පාසැලින් ඉවත්වූ පසුද,ඉගෙනීමට ඉගෙනීමේ පුරුද්ද මගින් සිය පූර්ණ පරිපූර්ණත්වය සඳහා අධ්‍යයන කේන්ද්‍රිය සමාජයක් තුළ යාවජීව ලෙසින් කෙරෙන අඛණ්ඩ ඉගෙනීම සඳහා අවශ්‍ය ශක්තිය ආකල්ප හා පුරුදු ලබා දීමත්ය.

මෙබඳු උදාර පරාමාර්ථයන් ඉටු කිරීම සඳහා රජය අපමණ මුදල් සම්භාරක භාරයක් වැය කරමින් හා නොයෙකුත් පහසුකම් හා නව ක්‍රම යොදවමින් සැම කෙනකුට ම නිදහස් අධ්‍යාපනයක් දීමට උත්සාහ ගනිද්දී එම සුපිරණමය අවස්ථා පැහැර හැර අවුම වශයෙන් 8 අවුරුදු අනිවාර්ය පොදු අධ්‍යාපනය වත් නො ලබා 40 % කට ආසන්න සංඛ්‍යාවක් රට පුරා ඇති පාසැල්වලින් ඉවත් ව යති.මෙයිනුත් විශාලම සංඛ්‍යාවක් ඉවත්ව යන්නේ ජීවිතයේ දොරටුව විවෘත වීමටත් පෙරාතුවය. සැම ශ්‍රේණියකදීම ඉවත්ව යාම සිදුවන අතර,ආරම්භක ශ්‍රේණිවලදී එය බහුලව සිදු වේ.මෙය බරපතල ගැටළුවකි.සියල්ලන් සඳහා බෙදා දෙන දෙයක් වුවත් කොටසක් එය ලබා නො ගෙන ඉවත් ව යති. ශ්‍රී ලංකාව පුරා විහිදී යන මෙම විශාල ගැටළුවෙහි පුළු කෙෂත්‍රයක් ආශ්‍රය කර ගෙන මොවුන් එසේ ඉවත් ව යන්නේ ඇයි? ඉවත් යාම්වල ස්වභාවය කෙසේද? ඉවත්ව යාමේ හේතු කවරේද? ඔවුන් ගේ ඉගෙනීමට ප්‍රතිශේධව බලපාන බලවේග මොනවාද? ඒවායේ ආකාරයන් හා විහිදී යාම් කෙබඳු ද ? ආදි කරුණු ගැඹුරින් විමර්ශනය කොට විශ්ලේෂණය කිරීම මෙම අන්වේෂණයේ අභිප්‍රායයි.ළමයින් පාසැල් නො ගොස් සිටීමට හේතු වන කරුණු මෙන් ම ඔවුන් පාසැලින් ඉවතට ඇද ගනු ලබන බලවේග ද විපරම් සහිතව සෝදිසි කර බැලීමට අදහස් කෙරේ.

ළමයකු නිසි වියට පෙර පාසැලින් ඉවත් ව යාමට හා පාසැල් නොගොස් සිටීමට හෝ කට්ටි පැනීමට, නැත්නම් පාසැල් නොරිස්සීමට,ප්‍රධාන හේතුන් දෙකකි.එනම් පාසැල තුළ ක්‍රියාත්මක වන බලවේග හා පාසැලින් පිටත එනම් නිවස හා නිවස හා සම්බන්ධ මාපිය උනන්දුව නැතිකම, දිළිඳුකම ආදි බලවේග යන දෙකයි.අනිකුත් හේතු සියල්ලම මේ ප්‍රධාන බලවේග දෙක ආශ්‍රය කරගෙන පවතී.මේ අනුව බොහෝ විට අසන්නට ලැබෙන දෙයක් නම් 'ළමයින් පාසැල් හැර යන්නේ ඇයි' යන ප්‍රශ්නය නැඟුන විට 'දුප්පත්කම,පාසැල,ප්‍රිය ජනක තැනක් නො වීම,මාපියන් ගේ නුගත්කම හා වුවමනාවක් නැතිකම ආදිය ඊට හේතු වන් බවයි.පිළිතුරු නිවැරදි විය හැකිය.නමුත් දුප්පත්කම පාසැල් නො යා සිටීමට බලපාන්නේ කෙසේද?දුප්පත්කම යනු කුමක්ද? එය පුද්ගලයාට එරෙහිව අරක් ගෙන ඔහුව වැනසීමට සිටින කළු ඉන්ද්‍රජාලා බලවේගයක් වැනි දෙයක් ද? මෙවැනි ප්‍රශ්නවලට ඇතැම් විට පැහැදිලි පිළිතුරු නො ලැබේ.දුප්පත්කම පාසැලින් ඉවත් ව යාමට හේතු වෙනවායැයි කීවාට කෙසේද හේතු වන්නේ කියා පැහැදිලි නැත.ඒ හා සම්බන්ධ සාධක තිබේ ද?ඒ සාධක බලපාන්නේ කිනම් අයුරින්ද කියාද දැක්වෙන් නේ නැත. පාසැල ප්‍රිය ජනක තැනක් නොවීම හේතුවනවාය කීවාට කෙසේද හේතු වන්නේ ? පාසැල ප්‍රිය ජනක තැනක් නොවේ නම් ඊට හේතු මොනවාද?හා සමහර විට අවශ්‍ය නම් සිසුන්ට පාසැල ප්‍රියජනක තැනක් බවට පත් කර ගත යුත්තේ කෙසේද වැනි ගැටළුවලට බොහෝ විට පිළිතුරු ලැබෙන්නේ ද නැත.

එනිසා ප්‍රත්‍යක්ෂපරීක්ෂණාත්මක වූ මෙම අන්වේෂණයේ අභිප්‍රාය මෙබඳු ව්‍යාකූල ප්‍රශ්නවලට කරුණු ගැඹුරින් සොයා බලා පිළිතුරු දීමට උත්සාහ කිරීමයි.

මෙහිදී ළමයින් ගේ නිවසේ පරිසරය හා මාපිය අපේක්ෂණ, අධ්‍යාපනය පිළිබඳව ඔවුන්ගේ වැටහීම් හා අගය කිරීම්, රැකියාව හා ආදායම් තත්වයන්, පවුලේ අධ්‍යාපනික පසුබිම, පවුලේ විශාලත්වය හා ඉගෙනීමේ වාතාවරණය මෙන් ම අධ්‍යාපනික චේතනාවලිය හා සංස්කෘතික බලපෑම් ( උදාහරණ: නව යොවුන් වියේ දී ඇති වන පරිවර්තන ගැන ඇති වැරදි සමාජ ආකල්ප ) ආදි කරුණු ද ළමයාට බෙහෙවින් බලපාන පාසැලෙන් පිටත සම කණ්ඩායම් හා අධ්‍යාපන තර්තෘකයන් ගේ බලපෑම් ගැන ද කරුණු විග්‍රහ කර බැලීමට අදහස් කෙරේ. එසේම අනෙක් ප්‍රධාන බලවේගය වන පාසැල් පරිසරය, එහි උගන්වන දේ හා විෂය මාලාව පිළිබඳ ළමයින් ගේ රුචි අරුචිකම්, උගන්වන ආකාරය හා උගන්වන ක්‍රම, පාසැලේ සමාජ දේශගුණය හා ගුරුවරුන් ගේ හා සිසුන් ගේ අන්‍යොන්‍ය පැවැත්ම, විනය පැවැත්ම, පන්ති පාලනය ආදිය මෙන් ම පාසැලේදී ළමයා ගේ ඉගෙනීමට ප්‍රතිශේධව බලපාන සමාජමය සුරක්ෂිත භාවය හා සමාජ සැකැස්ම වැනි වෙනත් කරුණු ද විමසා බැලීමට අදහස් කෙරේ. එපමණක් නොවේ, විමසෙන්නේ. ළමයා ගේ පැතුම්තල, ඉගෙනීමේ චේතනාවලිය හා පසුබටතාවය ද අනාගත බලාපොරොත්තු ආදිය ද සමාජ හා ආර්ථික බලපෑම් ද විමසිල්ලට ලක් කෙරේ. ඒ සමඟම යථෝක්ත ළමයින් ගේ පාසැල් කරණයන් (Performance ) අධ්‍යාපනික සාර්ථක අසාර්ථක භාවයන් , ප්‍රාප්තිය හැකියාවන්, පාසැල් පැමිණීමේ රටාවන් ආදිය අධ්‍යයනය කර බැලීමෙන් ගැටළුව තවදුරටත් පැහැදිලි කර ගැනීමට ද ඒ ඒ තත්වයන් පිළිබඳව විවෘති-කරණයක් කිරීමටද අපේක්ෂා කෙරේ. ගැටලු සහගත තත්වයන් අධ්‍යයනය ඒ හා සම්බන්ධ සාධක හා හේතූන් මතුකර පෙන්වා දීම පමණක් නොවේ, මෙවැනි ප්‍රත්‍යයක අධ්‍යයනයකින් බලාපොරොත්තු වනුයේ. එවැනි ගැටලු සහගත තත්වයන් මඟ හැරවීමට කළ යුතු ප්‍රතිකාරාත්මක කටයුතු පෙන්වා දීමට ද අපේක්ෂා කෙරේ.

මෙහිදී මේ රටේ මෙන් ම වෙනත් රටවල ද මේ ක්ෂේත්‍රය යටතේ කෙරී ඇති පරීක්ෂණ හා අධ්‍යයනය ද ආශ්‍රය කර ගෙන ගැටළුව පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කිරීම ද යථෝක්ත අරමුණු අතර වේ. විශේෂයෙන් ම වඩාත් ම අදාළ හා සමීප ප්‍රශ්නයන් බලපාන ආසියා-අප්‍රිකා හා ලතින් ඇමෙරිකානු රටවල මේ විෂය පිළිබඳව කෙරී ඇති අධ්‍යයනය උපයෝගී කර ගනිමින් එවැනි තුලනාත්මක විග්‍රහයක් වඩාත් ඔපවත් කළ හැකි වේයැයි අදහස් කෙරේ.

# REFERENCES


1. Learning to Be, The world of Education today and tomorrow, UNESCO 1972, place de Fontenoy, Paris, PP 42 - 43.
2. Bereday, G.Z.F. (1969) Essays on World Education,; The crisis of supply and demand, Oxford University Press, New York P 98.
3. International Bureau of Education, 22nd. session, 1970, UNESCO Geneva.
4. Educational Documentation and Information, Antecedents and consequences of early school leaving, first quarter, No. 182,1972, Bulletine of the International Bureau of Education, UNESCO P 7.
5. Progress of Education in the Asian Region, A statistical review of UNESCO Regional office for Education in Asia, Bangkok 1969, P 34.
6. Education Ordinance ,No 31 of1939. nxx6,xxxx
7. Sessional Paper, 111- Report of the committee on non school going children, 1960. Government Press, Colombo, P 6.
8. Matching Employment opportunities and expectations, a programme of action for Ceylon, 1971, ILO, Geneva P 153.
9. Ibidh P 15
10. 1973 January 19 Dinamina.
11. 1973 September 10th. Sinahala Dawasa.
12. Progress of Education in the Asian Region, a Statistical Review UNESCO regional office for Education in Asia - Bangkok, 1969 P 36.
13. Learning to Be, The World of Education today and tomorrow, 1972, XXXXXXUNESCO Paris.
14. Central Advisory Council for Education (England), (1967), Plowden Report, children anf their Primary schools Volume 1.
15. Rubin, J. L. (1969) Life Skills in School Society, Prepared by ASCD 1969, yearbook committee, NEA 129, New York, PP 15 - 33.
16. Meade J . E. (1969) Changing Society and its School, prepared by ASCD 1969, yearbook committee, Xxx NEA 120, New York - PP 35 - 51.
17. Searles, J.E. (1967) A System for Instruction, International textbook company, Pennsylvania, PP 3 - 12.
18. Coombs P. H. and Ray C.P. (1973). New Parhs to Learning, New York International Council for Educational development, PP 19 - 20
19. Dave, R.H. (1973), Life Long Education and School Curriculum UNESCO.
20. Phillips, H.M. (1970) Litracy and Development, UNESCO Place de Fontenoy, Paris 7 e P 21
21. Stevenson, A (1965). The Centrality of Education, Educational record (Fall 1965) P 345; in Searles J.E. (1967) A System for Instruction Inyernational text Book Company, Pennsylvania.

## දෙවන පරිච්ඡේදය

## පෙර කරන ලද අන්වේෂණයන් ගේ සමාලෝචනයක්.

==================

අනිවාර්ය පාසැල් විය ඉක්මවීමටපෙර විධිමත් අධ්‍යාපනය අවසන් කිරීමේ ගැටළුව, වෙනත් ලෙසකින් කියනවා නම් අනිවාර්ය අධ්‍යාපන අවස්ථාවේ දී සිදුවන අපතේ යාම (wastage) ජාතික ප්‍රශ්නයකි. එසේම එය ජාත්‍යන්තර ප්‍රශ්නයක් ද වේ. මෙම ගැටළුව දෙස බැලීමට විවිධ ප්‍රයත්න දරා ඇත. සමීක්ෂණ, ප්‍රත්‍යෙක අධ්‍යයන හා ශිල්පීය සම්මන්ත්‍රණ (Technical Seminars ) ආදි ක්‍රමවලින්ය ඒ ප්‍රයත්නයන් දරා ඇත්තේ. අපරටේ මෙන් ම වෙනත් රටවල ද කරනු ලැබ ඇති මෙම අධ්‍යයන විමසා බැලීම කරුණු කීපයක් නිසා මෙහිලා වැදගත් වේ.

මෙතරම් බැරෑරුම් ගැටළුවක් දෙස ඇස හැර බැලීම සඳහා අන්‍යයන් ගේ අවධානය යොමු කරවන නිසා පළමුවෙන් ම මෙවැනි අධ්‍යයන වැදගත් බව කිව යුතුය. දෙවනුව මෙම අන්වේෂණයෙන් අනාවරණය කර ගැනීමට අපේක්ෂා කෙරෙන කරුණු හා සාධක වඩාත් සාර්ථක ලෙසින් මතු කර ගැනීමට හා පැහැදිලි කර ගැනීමට පිටිවහල් කර ගත හැකි නියාද වැදගත් වේ. ගැටළුව දෙසට පිවිස ඇති ආකාරය (Approach) ගැටළුවේ බරපතලකම, එහි වර්ගීකරණ, බලපාන සාධක හා මේ කරුණු අනාවරණය කර ගැනීමට යාමේ දී මතුවන දුෂ්කරතා ආදිය එහි දී මූලික ව වැදගත් වන කරුණුය. ගැටළුව ජය ගැනීම සඳහා කළ යුතු ප්‍රතිකර්ම ආදිය කවරේද? වඩාත් ඉක්මනින් හා පහසුවෙන් යෙදිය යුත්තේ කවර ප්‍රතිකර්මද යන්න හා ඒ පිළිබඳව අනෙකුත් රටවල් විසින් ගනු ලබන පියවරවල් මොනවාද? අපට ඒවායින් ගත හැකි ආදර්ශ මොනවාද? ආදිය දැන ගැනීමට තවදුරටත් එම අධ්‍යයන මහඟු ආධාරයක් වේ. ඒ නිසා මේ විෂය ක්ෂේත්‍රය ගැන අප රටේ මෙන් ම වෙනත් රටවල ද මීට පෙර කර ඇති අධ්‍යයන ගැන විමසා බැලීම වැදගත් බව පෙණේ.

### ලංකාවේ කරන ලද අධ්‍යයයන.

============

### ජයසූරිය ගේ (1960 ) අධ්‍යයනය.

අනිවාර්ය පාසැල් විය ඉක්මීමට කලින් විධිමත් අධ්‍යාපනය අවසන් කිරීමේ ගැටළුව ගැන ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ම අධ්‍යයනයක් කර ඇත්තේ ජේ.ඊ.ජයසූරිය මහතා විසිනි. " ලංකාවේ විධිමත් අධ්‍යාපනය විමසීමට ප්‍රථම පාසැල් හැර යාම පිළිබඳ අධ්‍යයන කීපයක් " x1 නමින් යුත් මෙම අධ්‍යයනය කර ඇත්තේ තවත් පිරිසක ගේ ද සහයෝගයෙනි.

මෙය කොටස් දෙකකින් යුක්තය. පළමු වර්ගයට තෝරා ගත් නියැදියේ සියලුම පාසැල් ඇතුළත් කර ඇති අතර, දෙවන වර්ගයේ දි තෝරා ගත් පාසැල් පමණක් ඇතුළත් වී ඇත.

1. පළමුවන වර්ගය.

පාසැල් පරීක්ෂක කොට්ඨාශ තුනක් නියැදිය ලෙස ගෙන (අගලවත්ත පා.ප.කො., කිරිඳිවැල පා.ප.කො., හා රිකිල්ලගස්කඩ පා.ප.කො.) අධ්‍යයන කළ මේ ක්‍රමයේ දි මණ්ඩලයේ සැම පාසැලක් ම සමීක්ෂණයට ඇතුළත් කර ඇත.

11. දෙවන වර්ගය.

සීමා කරන ලද පරිමාණයකින් යුතුව අර්ධ නාගරික ප්‍රදේශයක (බලපිටිය) පාසැල් තුනක් හා ග්‍රාමීය ප්‍රදේශයක ( ඉබ්බාගමුව ම.ම.වි.) පාසැලක් ද පිළිබඳව අධ්‍යයනය කිරීම.

පළමු වර්ගයේ නියැදි පාසැල් වලින් හය මසක් ඇතුළත ( 1957 ඔක්තෝබර් 1 වැනිදා සිට 1958 මාර්තු 31 දක්වා ) විධිමත් අධ්‍යාපනය නිම කිරීමට ප්‍රථම ඉවත් ව ගිය ළමයින් සමීක්ෂණයට භාජනය කර ඇත.

දෙවන වර්ගයට අයත් නියැදියේ ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය හා බලපිටියේ පාසැලින් තුනකින් ද 1953 දී හය වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබා ඉවත් ව ගිය අය පිළිබඳ තොරතුරු එක් රැස් කර ඇත.

පාසැලින් ඉවත්ව යාම පිළිබඳ සාධක.

පාසැලින් ඉවත් ව යාමේ කඩඉම් හතරක් මෙහිදි දක්වා ඇත. පළමුව වඩාත් ම ඉක්මනින් එනම්, තුන්වන ශ්‍රේණිය සමත් කර ඉවත් ව ගිය අය ගැන දැක්වේ. අධ්‍යාපනයේ ඵල ප්‍රයෝජන යාම්තමින් ලබා මෙසේ ඉවත් ව ගිය අය කිරිඳිවැල හා අගලවත්ත නියැදියේ මුළු සංඛ්‍යාවෙන් 25 % ක් වන අතර, රිකිල්ලගස්කඩ ඒ ප්‍රමාණය 45 % කි.

දෙවන කොටස හයවන ශ්‍රේණිය දක්වාවත් ඉගෙනීම නො ලබා ඉවත් ව ගිය අයයි. අගලවත්ත හා කිරිඳිවැල නියැදියේ මෙම ප්‍රමාණය 60% ක් වන අතර, රිකිල්ලගස්කඩ 75% කි. තුන්වන කඩඉම පාසැල් හැර යාමේ ( අනිවාර්ය) සීමාව වන අවුරුදු 14 ට පෙර ඉවත්ව ගිය අයයි. මේ ප්‍රමාණය අගලවත්ත හා කිරිඳිවැල නියැදිවල 75% ක් වන අතර, රිකිල්ලගස්කඩ නියැදියේ එය 80% කි. හතරවන කඩඉම වශයෙන් දක්වන්නේ උපරිම අනිවාර්ය සීමා වූ අවුරුදු 14 ට පසු පාසැල් හැර යාමයි. අගලවත්ත හා කිරිඳිවැල නියැදිවල මේ ප්‍රමාණය 25% ක් වන අතර, රිකිල්ලගස්කඩ 20% කි. මේවායින් පැහැදිලි වන දෙයක් නම්, සමස්තයක් වශයෙන් ගත් කළ පාසැලෙහි වැඩි ම කාලයක් රැඳී සිටි ප්‍රමාණය අල්ප බවත්, හැකි තාක් වේලාසනින් ඉවත්ව ගිය ප්‍රමාණය අධික බවත්ය.

ඉවත්ව යාමට හේතු.

ආර්ථික තත්වය.

මාපියන් ගේ පහත් ආදායම් තත්වය ළමයින් වඩාත් ඉක්මනින් පාසැල් වලින් ඉවත් යාමට හේතු වී ඇති බව මේ අධ්‍යයන වලින් පෙනී ගොස් ඇත. එහෙත් දුප්පත්කම පාසැල් හැර යාමට එකම හේතුව නොවේ. ඉතාම දුප්පත් පවුලක වුවත් වැඩිදුර ට ඉගෙනීම ලබමින් සිටි ළමයින් හමු වී ඇති බව දක්වා ඇත.

පවුලේ ප්‍රමාණය:

පවුල විශාල වීම හා ඉවත්ව යාම අතර, වැදගත් සම්බන්ධයක් ඇති බව පෙනී ගොස් ඇත. පහත් ආර්ථික තත්වයන් ඇති අය ගේ පවුල් විශාල අතර, ඔවුන් ගේ ළමයින් වඩාත් ඉක්මනින් පාසැල් වලින් ඉවත් කර ගෙන තමන් ගේ සහායට ගෙදර නවත්වා ගනිති.

ළමයින් ගේ හා මාපියන් ගේ රැකියා අභිලාෂයන් පාසලෙන් ඉක්මනින් ම ඉවත් ව යාම කෙරෙහි බලපාන ප්‍රබල කරුණක් බව මෙහිදි පෙනී ගොස් ඇත. ද්විතීය අධ්‍යාපනයේ කඩඉම වල් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වුවද බොහෝ දෙනකුට රැකියා ලබා ගැනීමට නො හැකි වේ. එහෙත් එතරම් දුරට ඉගෙන නො ගෙන මඳ දුරක් පාසැල් ගොස් අස් වී තුමන හෝ රැකියාවක එයින් වැඩිම පිරිසක් යෙදී ඉපයීම් ද කරති. මාපියන් ගේ ආකල්ප අතින් බලන විට ජ්‍යෙෂ්ඨය සමත් වී රැකියාවක් නොමැතිව ලත වෙනවාට වඩා මෙය ඵලදායි දෙයකි. සමාජමය අතිනුත් ඒ ආකල්පය එසේම වන අතර, රැකියා නැති තැනැත්තා සමාජයේ අවමානයට ද ලක් වේ. මේ අනුව විභාග සමත් වී එහෙත් රැකියාවක් නොමැතිව සිටින තැනැත්තාට වඩා වැඩි දුර ඉගෙනීමක් නො ලබා එහෙත් මොන යම් හෝ රැකියාවක යෙදී සිටින තැනැත්තාට සමාජයේ තැනක් ඇත. එනිසා මෙවැනි තත්වයක් තිබෙන විටක මාපියන් විසින් වඩාත් ඉක්මනින් පාසැල් හැර යාම ධෛර්යමත් කරන්නේය යන්න හෝ ඊට අනුබල දෙන්නේය යන්න ගැන පුදුම වීමට කරුණක් නොමැති බව දැක්වේ. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ජ්‍යෙෂ්ඨය ස සමත් වූ අයට රැකියා ප්‍රශ්නයක් නැති අතර, එබඳු පාසැල් වලට යන ළමුන් අතර, වේලාසනින් ඉවත් යාමේ ප්‍රශ්නය අඩු බවද දැක්වේ.

අනෙක් සියලුම නියැදිවලට අයත් ප්‍රදේශවලට වඩා ඉබ්බාගමුව ග්‍රාමීය ප්‍රදේශයක් වුවත් ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සඳහා ළමයින් සූදානම් කිරීමට මෙන් ම විශ්ව විද්‍යාලයට යැවීම සඳහා ද රජයේ මධ්‍ය මහා විද්‍යාලයක් එහි ඇත. එනිසා ඉගෙනීමේ ප්‍රයෝජනවත් බව වටහා ගැනීම අනික් අනෙ ප්‍රදේශ වලට වඩා ඉබ්බාගමුව උසස්ය. මාපියන් ගේ දුප්පත්කම – පහත් ආදායම් තත්වය හා පවුලේ විශාලත්වය වැනි කරුණු ප්‍රතිශේධව බලපෑවත් වඩාත් ඉක්මණින් පාසැල් හැර යාම එහි අඩුය. ඉහත කී සාධක ගැන බලන විට දුප්වල ආර්ථික තත්වය හා පවුලේ විශාලත්වය හා රැකියා කෝණයෙන් බලන විට ඉගෙනීමේ ඇති ප්‍රයෝජනවත් බව ආදිය ඉක්මණින් ම ඉවත් යාමට ධෛර්ය දෙන බව පෙනී ගොස් ඇත. අනිවාර්ය අධ්‍යාපනයවත් නො ලබා ඉවත් ව යන දුප්පත් පන්තියේ ළමයින් ගැන බලන විට, සිංහල ජ්‍යෙෂ්ඨය දක්වා ඉගෙන රැකියා නැති ගොඩට වැටෙන්ට නො සිට ඊට පෙර පාසැලින් අස්වී රැකියාවක යෙදී ඉපයීම ආර්ථික වශයෙන් වාසිදායකැයි සිතති.

මෙහිදී පාඨශාලාවල අනුගමනය කෙරෙන විෂය මාලාවේ දෝෂ දක්වා ඇත. ඉගැන්වෙන දේවල් ප්‍රිය නොවීමද ඉවත්ව යාමට හේතු වී ඇත. ළමයින් ගේ හා ප්‍රජාවේ ද අවශ්‍යතා, වෘත්තීමය අවශ්‍යතා නො සපිරෙන එංගලන්තයේ ඉහලම බුද්ධිමත් ටික දෙනාට ගැලපෙන ලෙස සකස් වූ වියරණ පාසැල් විෂය මාලාව ලංකාවේ පාසැල්වලද යොදා ගෙන තිබීම ළමයින් ගේ අරුචිය වැඩිවීමට හේතු වී ඇති බව පෙන්වා දී ඇත.

වැඩිදුර කරුණු:

පිරිම ළමයින් ට වඩා ගැහැණු ළමයින් ගේ ඉවත් යාමේ කරණත්වයේ වඩාත් සංකීර්ණ රටාවක් ඇති බව මේ අධ්‍යයනයේ දී පෙනී ගොස් ඇත. සමහර මාපියෝ පිරිමි අයට මෙන් ම ගැහැණු ළමයින්ට – රැකියා කෝණය අතින් බලන විට – වැඩිදුර අධ්‍යාපනයක් අනවශ්‍යයැයි සිතා පාසැලින් ඉවත් කර ගන්නා අතර, තවත් විටක මාපියන් තම පිරිමි ළමයින් හදිසියේ ලැබුන රැකියාවකට යැවීම සඳහා අස්කර ගැනීම දක්නට ඇත. එහෙත් ඒ අතර, සිය දියණියන් ගේ ඉගෙනීම දිගටම කර ගෙන යාමට ඉඩ දෙති. එසේ ඉඩ දෙන්නේ නිවසේ දී වෙනත් ඵලදායි කාර්යයක යෙදීමට නැතිනම්ය. තවද, පවුල ක්‍රමයෙන් විශාල වන විට පිරිමින්ට වඩා ඉක්මණින් ගැහැණු ළමයින් අස් කර ගනිති. මාපියන් නිතරම ප්‍රයෝජනවත් බව ගැන කල්පනා කරන බවත් එසේ බලන විට පාසැල් යාම ඵලදායි දෙයක් නොවන බවත් ඔවුන්ට පෙනී යයි. කුඩා පවුල්වල ඇතැම්විට ඉක්මණින් විවාහකර දීම සඳහා ගැහැණු ළමයා වේලාසනින් ම අස්කර ගනී. නමුත් ගැහැණු ළමයින්ට දිගටම ඉගෙනීමට අවස්ථාව ලබා දීම සාමාන්‍යයෙන් පොදු ලක්ෂණයක් බව මෙහිදී පෙන්වා දී ඇත.

කුල ගෝත්‍රවල බලපෑම්:

පාසැලින් ඉවත්ව යාම කෙරෙහි ළමයින් ගේ කුල ගෝත්‍ර ද බලපාන බවට එක එල්ලේ සාධක නො ලැබුන නමුදු රිතිල්ලගස්කඩ නියැදිය ගැන බලන විට කුල භේදයේ බලපෑම ඇති බව ද ඒ පිළිබඳව ගුරුවරුන් සම්මුඛයෙන් ම ශ්‍රද්ධාරෝපණයෙන් නිදහස් නො වන බවද සඳහන් වේ.

අනිවාර්යයෙන් පාසැල් පැමිණීමේ නීති පනවා තිබුණත් ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය ඵලදායි යාන්ත්‍රිකමය ශක්තිය හා තාමත් නැති බව දැක්වේ. අනෙක් අතට සියලුම ළමයින්ට ඉගෙනීමට කරම් ප්‍රමාණවත් වන පාසැල් ගොඩනැගිලි හා ඉඩකඩ නො සලසා හා විෂය මාලාව ළමයින් ගේ සිත් ගන්නා පරිදි විසිතුරු නො කොට පැමිණීමේ නීති පමණක් ක්‍රියාත්මක කර වීමට යාම හිස් දෙයක් බවත් අවධාරණය කරවයි.

ඉගෙනීම කෙරෙහි සකාර්ය ආකල්ප ඇති හෝ නැති ළමයින් සියලු දෙනා ට ම ඉක්මණින් පාසැල් හැර නො යන ලෙස කීම හෝ සිය මාපියන්ට ඒ ගැන අවශ්‍ය උපදෙස් දීම මුල්ගුරුවරුන් විසින් කරනු ලැබුවේදැයි යන්න ගැන සාධක නො ලැබුණු බව දක්වයි. කෙසේ වෙතත් අතීතයේ තිබුනාක් මෙන් ළමයින් ගේ පැමිණීමේ ප්‍රමාණයට අනුව ගුරුවරුන්ට වැටුප් ගෙවීමේ ක්‍රමය ගැන මෙහිදී අවධානය යොමු කර ඇත. ඒ ක්‍රමයේ දි ළමයින් හැකි තාක් පාසැලේ නවත්වා ගැනීමට උත්සාහ කෙරෙන අතර, ළමයින් ගේ වැඩිදුර ඉගෙනීම ගැන ද වැඩි අවධානයක් යොමු කෙරේ.

## 1960 පාසැල් නොයන ළමුන් පිළිබඳ කමිටු වාර්තාව.

ලංකාවේ පාසැල් නොයන හා අනිවාර්ය පාසැල් විය ඉක්මමට කලින් සහ පාසැල් වලින් ඉවත් ව යන ළමයින් පිළිබඳව කරන ලද තවත් පුළුල් අධ්‍යයනයකි මෙය.[2] අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයීමෙන් යුක්ත මෙම කමිටුවේ පරමාර්ථය වී ඇත්තේ පාසැල් යා යුතු වියේ ළමයින් විශාල සංඛ්‍යාවක් පාසැලින් ඉවත්ව යාමට හේතු වන කරුණු සොයා බැලීමත්, දිවයින පුරාම මෙකී ළමයින් විසිදී යන රටාව සොයා බැලීමත්, පාසැල් නො යාම හා බාලාපරාධ අතර සම්බන්ධතාවයක් තිබේද යන කරුණු විමසීමත් හා මේවාට යෙදිය හැකි, යෙදිය යුතු, පිළියම් ද යෝජනා කිරීමත්ය.

සමීක්ෂණය කොටස් දෙකකින් යුක්තය. එනම් ලංකාවේ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ ඇතුළත් මුළු ජනගහනය පිළිබඳ සමීක්ෂණය හා වතු අංශය පිළිබඳ සමීක්ෂණය ද යනුවෙනි. මුළු දිවයින සඳහා ම වන සමීක්ෂණයට යොදා ගෙන ඇත්තේ ලංකාවේ ජනගහන කොටස් කිරීම්වල ලේඛනයන්ය.( 1953 ජන ලේඛනය)මෙම ජනගහන කොටස් කිරීම්වලින් එකකට, ගෙවල් 50 ක් පමණකින් යුක්ත ප්‍රදේශයක් අයිතිය. මෙම කොටස් කිරීම් 512 ක් සමීක්ෂණයට අයත් වන අතර, මුළු දිවයිනේ ම එකී ජනගහන කොටස් කිරීම් මුළු සංඛ්‍යාවෙන් 1½ % ක් ඊට අඩංගුය. එවිට නියැදියට එවකට වූ මුළු ජනගහනයෙන් 1½% ක් අයත් වේ. නාගරික හා ග්‍රාමීය වශයෙන් දිවයිනේ එවකට තිබූ අධ්‍යාපන දිස්ත්‍රික්ක 20 තුළ වෙන වෙනම අධ්‍යයනය කර තොරතුරු ලබා ගෙන ඇත. වතු අංශය සඳහා වූ සමීක්ෂණයට යොදා ගෙන ඇත්තේ ලංකාවේ ඉන්දිය වතු කම්කරු ජනාතව සඳහා වූ වතුවල ලේඛනයන්ය.

සමීක්ෂණය සඳහා අවශ්‍ය දත්ත සොයා ගෙන ඇත්තේ ප්‍රශ්නාවලී මාර්ගයෙනි. සිසුන්, මාපියන්, ගුරුවරුන් හා ප්‍රජාවේ වෙනත් අය ද සඳහා වන ලෙසින් ප්‍රශ්න 32 කින් යුක්ත ප්‍රශ්නාවලියක් මේ සඳහා යොදා ගෙන ඇත.

ප්‍රථමයෙන් ම පාසැල් නොයන්නන් ගේ ප්‍රමාණයන් දක්වා ඇත. ඒ පිළිබඳ ව බලන විට එය සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටී ඇති බව දැක්වේ. 1950 දී අනිවාර්ය සීමාවේ දී පාසැල් නො යන්නන් ගේ ප්‍රමාණය 34.9% ක් වන අතර, 1958 දී 23.8 % ක් දක්වා එය පහත වැටී ඇත. දිස්ත්‍රික්ක අනුව බලන විට එවකට තිබූ දිස්ත්‍රික්ක 20 තුළ අවුරුදු 5-14 අතර, පාසැල් වයස්හි සිටින ජනගහනය 1997000 ක් විය. මෙයින් 412000 ක් ම ( 20.6% ) පාසැල් නොයමින් සිටි අයයි. පාසැල් නො යන අයගෙන් වැඩි ප්‍රමාණයක් සිට ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයේ වන අතර, අඩුම ප්‍රමාණයක් යාපන දිස්ත්‍රික්කයේ ය. පාසැල් නො යන මුළු අයගෙන් බදුල්ලේ එම ප්‍රමාණය 40.2% ක් ද යාපනයේ 10.2% ක් ද විය. කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගරය හා අනෙක් නගරවලද පාසැල් වියේ ළමයින්ගෙන් දෙලක්ෂයකින් විසිහත්දාහක්ම (13%) පාසැල් නො යන අයයි. කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පෙදෙස්වල මේ ප්‍රමාණය 11% කි.

වයස් අනුව පාසැල් නො යාම ගැන බලන විට අවුරුදු පහේදී එය ඉහළ ප්‍රමාණයක් වන අතර, ( 33.0%) අවුරුදු 9 වන විට එහි බැස්මක් (9.3%) පෙනෙතත් අවුරුදු 10 සිට නැවත වේගයෙන් නැගගෙන ගොස් අවුරුදු 14 දී 44.7% දක්වා වැඩිවෙන බව පෙනේ. 1958 සංඛ්‍යා ලේඛන අනුව මේ ප්‍රමාණය වයස අවුරුදු 5 හේ දී 25% ක් වන අතර, වයස අවුරුදු 14 දී 58% ක් දක්වා නැග ඇත. අනිවාර්ය සීමාවේ දී පාසැලින් පිටත සිටි ප්‍රමාණය මේ අනුව 20.6% කි.

නොපැමිණීමට හේතු .

දුප්පත්කම:

48.79% ක්ම පාසැල් නො යන්නේ මේ හේතුව නිසාය. දුප්පත්කම යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද? ළමයින්ට දිවා ආහාරයක් සැපයීමට දෙමාපියන්ට ඇති අපහසුවද? එසේ නම් රජය විසින් දිවා ආහාර වේලක් සැපයීමෙන් පසුවද පාසැල් යන අය ගේ ප්‍රමාණය වැඩි නො වූයේ මන්ද? මෙවැනි ප්‍රශ්න මෙහිදි මතුකර අ,ත. කොයි හැටි වෙතත් ළමයින් සඳහා රසවත් ආහාර වේලක් සැපයීමට මාපියන්ට ඇති අපහසුව මෙහිදි සැලකිය යුතු කරුණක් බව දක්වා ඇත. ළමයින් ට අවශ්‍ය ඇඳුම් පැළඳුම් හා වෙනත් උපකරණ සපයා දීමට නො හැකි කම මතු කර දක්වන තවත් කරුණකි. මාපියන් ගේ දුප්පත්කම නිසා මෙම ළමයින්ට නිදහස් අධ්‍යාපනයේ අයිතිවාසිකම් නො දි සිටීම හෝ නැහැය බැහැය කියා පැහැර හැරීම බලවත් අසාධාරණයක් බව අවධාරණය කරන අතර, ආර්ථික වශයෙන් පහත් තත්වයකින් යුත් මෙම ළමයින්ට අධ්‍යාපනය දීම සඳහා වත් පොහොසත්කම් ඇති අය මෙන් ම 1939 අධ්‍යාපන ව්‍යවස්ථාවේ සඳහන් කොට ඇති පරිදි පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් විය හැකි බව තවදුරටත් පෙන්වා දි ඇත.

සිත් නො ගන්නා විෂය මාලාව.

පාසැල් නොයාමට මෙයද සෑහෙන හේතුවක් වි ඇත. ප්‍රතිචාර දක්වා ඇති අයගෙන් 12.02% ක් ම නොපැමිණෙන්නේ මේ හේතුව නිසාය. ළමයින් ගේ ලැදියාවන් හා ක්‍රියාකාරකම් මත පදනම් වූ විෂය මාලාවක් පාසැලේ නැති නිසා පාසැල් පැමිණීමට ප්‍රිය නො කරති. සිත් ගන්නා විෂය මාලාවක් තිබේ නම් ළමයින් ගේ ඇල්ම වැඩි වන නිසා පාසැල් පැමිණීමද ඉබේම වැඩි වේ. පාසැල තුළ ක්‍රියාත්මක වන මෙවැනි බලවේග ළමයින් ගේ ඉගෙනීමට බාධකව සිටින බව මේ අනුව දැක්වේ.

පාසැල් හිඟය හා තදබදය වැඩිකම:

පාසැල් නොයාමට ප්‍රධානම හේතුවක් නොවුවත් මෙයද කාරණයක් බව දැක්වේ. ප්‍රශ්නාවලියට දි ඇති ප්‍රතිචාර අනුව 4.12% ක් නොපැමිණෙන්නේ මේ හේතුව නිසාය. සමහර ප්‍රදේශයන් හි පාසැල්වල අධික තෙරපීමක් ඇත. කොළඹ, ඌව හා සබරගමුව වැනි පළාත්වල මේ තත්වය පවතී.

දිගු කාලින පාසැල් ජීවිතයක අවශ්‍යතාවය හා අගය පෙන්වා දෙන මේ කමිටුව, අනිවාර්ය අධ්‍යාපන නීතිය නොපමාව ම ක්‍රියාත්මක කළ යුතු බවද උපරිම වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම යථා කාලයේ දි සිදුවිය යුතු බවද පෙන්වා දෙති. මනාව ගොඩනැගුනු අXX වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක් නැති නිසා වඩාත් ඉක්මනින් පාසැල්වලින් ඉවත් ව යන මේ පිරිස අවුරුදු කීපයක් ඇතුළත නූගත්භාවයට පත් වේ. ඒ නිසාද දිගු කාලින අධ්‍යාපනයක් අවශ්‍යය. ඊට වඩා පුද්ගලයා නියම ලෙසින් සංවර්ධනය වි සමාජයේ අන්‍යයන් සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගෙන ජීවත්වීම සඳහා ද වැඩිදුර අධ්‍යාපනයක් අවශ්‍ය බව පෙන්වා දෙයි. ඉහතින් ද සඳහන් කරන්ට යෙදුන පරිදි වයස අවුරුදු 14 දි 58% ක් පමණම පාසැල් හැර යති. අනිවාර්ය අධ්‍යාපන විය අවුරුදු 15 දක්වාවත් වැඩි කළහොත් මේ පිරිස ස්වල්පයකින් හෝ අඩුකර ගත හැකි බව පෙන්වා දේ. තවද, අනිවාර්ය පාසැල් පැමිණීමේ නීතියට අනුව එය ක්‍රියාත්මක කරමින්, පෙරමෙන් ළමයින් ගේ පැමිණීම ගැන සොයා බලන නිලධාරින් පත් කළ යුතු අතර, පාසැල් පැමිණීමේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඇතැම් රටවල ක්‍රියාත්මක අන්දමට ගම්මුලාදැනි තැන හා පොලිස් නිලධාරින් ද සහයෝගී කර ගත යුතු බව නිර්දේශ වශයෙන් දක්වයි.

බාලාපචාරය හා පාසැල් නොයාම:

මෙහිදි බාලාපචාරයට පෙළඹුන පුද්ගලයින් 2829 දෙනෙක් අධ්‍යයනයට භාජනය කර ඇත. මේ පිරිසෙන් 87% ක් ම නූගත් අය වන අතර, 55% ක් කිසි දිනක පාසැල් නොගිය අයයි.